# උතුරු පළාත් රාජ්‍ය සේවයේ පෙර පාසැල් ගුරු සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාග – 2017

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පෙර පාසැල් ගුරු සේවයේ III වනි ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 41ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2017 ජූලි මස යපනයේදී පවත්වෙන බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **16.06.2017**වේ.

**02 බඳවා ගැනීමේ සේවා කොන්දේසි:-**

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පෙර පාසැල් ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ අනුමත කරන ලද කොන්දේසි සහ බඳවා ගැනීමේ ව්‍යවස්ථාවේ විධිවිධාන යනාදිය හා ඒවායෙහි කලින් කලට සිදු කරනු ලබන වෙනස් කිරීම් වලටත්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා සමාජවාදි ජන රජයේ අංක 1817/30 සහ2013.07.03 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගන්නා ලද අයදුම් කරුවන් එම තනතුරේ 111 වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසර 03 පරිවාස කාලයක් යටතෙ 111 වැනි ශ්‍රේණි තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පෙර පාසැල් ගුරු සේවයේ III වනි ශ්‍රේණියට බඳවා ගන්නා ලද දිනයේ සිට වසර 03 ක කාලයක් ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩයිම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරු සහිත සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබන අය උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතු බවට වූ කොන්දේසියට යටත්විය යුතුය.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන්නෙකු එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළයුතු බවට අනිවාර්ය වූ කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දි නිකුත් කරණු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට පෙර එහි සඳහන් දෙවැනි රාජ්‍ය භාෂාවකින් සමත්විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කරණු ලබන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරණු ලැබේ. ඇතැම් පුරප්පාඩු හෝ සම්පූර්ණ පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත. පත්කරනු ලබන නිලධාරි සංඛ්‍යාව 41 වේ. පුරප්පාඩු සංඛ්‍යාවේ අවසාන පුරප්පාඩු කීපයකට සමාන ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් කීපදෙනක් ඇති වූවිට එවැනි පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිවිධානයේ 80 ජේදයට සඳහන් කර ඇති පරිදි පත්කිරීම් බලධාරියා විසින් කටයුතු කරනු ලබේ.

**03 වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **03/2016 හි වැටුප් කේත අංක MN-1-2016 අනුව** බඳවා ගනු ලබන පෙර පාසැල් ගුරු සේවයේ III ශ්‍රේණියට, අදාල වන මාසික වැටුප් පරිමාණයරු: 27,140/= - 10x300 - 11x350 - 10x495 - 10x660 - 45,540/=වෙ. (රු. 28,040/= වැටුප් පියවරට පැමිණීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමකින් සමත් විය යුතුය.) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

**04 සාමාන්‍ය සුදුසුකම්:-**

04.1 අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

04.2 කාන්තා අයදුම්කරුවන් විය යුතුය.

04.3 උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. එනම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වර්ෂ 06ක කාලයෙන් අඩුම වශයෙන් වර්ෂ 03ක් වත් උතුරු පළාත තුළ ස්ථිරව හා නොකඩවා පදිංචිය ඇති අයෙකු විය යුතුය.

හෝ

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අවම වශයෙන් අවුරුදු 05ක් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටිය යුතුය.(සම්මුඛ පරීක්ෂණයේදී ස්ථිර පදිංචි තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

04.4 අයදුම්කරු හොඳ චරිතයකින් යුක්ත විය යුතුය.

04.5 එක් අයදුම්කරුවෙකු එක් දිස්ත්‍රික්කයකට අමතරව අනෙකුත් පුරප්පාඩුවලට අයදුම් කළ නොහැක. අයදුම්කරු විසින් තෝරා ගන්නා ලද දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ධිස්ත්‍රික්කය | ධිස්ත්‍රික් අංකය |
|---|---|
| යාපනය | 1 |
| මන්නාරම | 2 |
| වවුනියාව | 3 |
| කිලිනොච්චිය | 4 |
| මුලතිවු | 5 |

04.6 මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙරඹ්‍රි ඉල්ලුම් කරන ලද සියලුම සුදුසුකම් ලබා තිබිය යුතුයි.

04.7 අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු **18 ට නොඅඩු හා අවුරුදු 40ට** නොවැඩි වියු යුතුය.

## 05 අධ්‍යාපන සුදුසුකම්:-

### 05.01 අධ්‍යාපන සුදුසුකම් :-

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය යන විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරකට සම්මාන සමාර්ථ සහිතව එකවර විෂයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් විය යුතුය.

**සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් (01)එක් විෂයක්වත් සමත් වී තිබීම(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

### 05.02 වෘත්තීය සුදුසුකම් :-

විශ්ව විද්‍යාල/ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයකින්

හෝ

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය/ තෘතීයික වෘත්තීය අමාත්‍යාංශය මගින් පිළිගත් කුමන හෝ ආයතනයකින්

ලබා ගත් එක් අවුරුද්දකට නොඅඩු පෙර පාසැල් අධ්‍යාපනයට අදාළ ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

## 06 බඳවා ගැනීමේ ක්‍රමය:-

06.1 ලිඛිත පරීක්ෂණයක් පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දි බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනිමේ පරිපාටිය ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව බඳවා ගනුලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දි පරීක්ෂා කරණු ලැබේ. අවශ්‍යවන සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වු හිමිකම් අවලංගු කරණු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දි සියලු සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මේ අවස්දාවේදි ඡේදය 11.2 සඳහන්වු පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

06.2 ඉහත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් ඔවුන් ලැබු මුලු ලකුණුවල අනුපිලවෙල අනුව පවතින පුරප්පාඩුවලට පත්විම් ලබාදිම සඳහා තෝරාගනු ලැබේ.

06.3 පුරප්පාඩු වලින් 3% ක් ආබාධිත පුද්ගලයන් සඳහා (ආබාධිත තත්වය)වෙන් කර ඇත. පත්විම් සඳහා තෝරා ගැනිමේදි ආබාධිත පුද්ගලයන් රාජකාරි කිරිමට එම ආබාධිත තත්වය රාජකාරියට බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතු ය.

## 07 විභාග ගාස්තු :-

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී රු.500/= ක් මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **3401** දරණ තැන්පත් ගිණුමට ගෙවීම් කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවෙහි නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරිමට අනුමත කරනු නොලැබේ.

**08 ඉල්ලුම් කරන ක්‍රමය:-**

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ ( සෙමී 21 x සෙමී 29) ප්‍රමාණයේ කොළයක 01 සිට 11.2 දක්වා වූ කොටස් පළමු වැනි පිටුවේත්, ඉතිරි ඒවා අනෙක් පිටුවේත් ඇතුලත්වන පරිදි අයදුම් පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2017.06.16** වැනි දිනට හෝ ඊට පෙර ලැබීමට හැකිවන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවාකොමිෂන්සභාව, උතුරු පළාත අංක :393/48, කොවිල් පාර, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

08.2 එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ පෙර පාසැල් ගුරු සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගණු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ.විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවනු ලැබීම අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බව අදහස් නොකෙරේ.

08.4 අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් ඒ බව පහත සඳහන් විස්තර සහිතව **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කොවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය 021- 221 9939, ෆැක්ස්අංකය 021- 221 9940)

**සටහන:**

ඉල්ලීමේ ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුණුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල්ලිපිනය, අයදුම් පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය ලියාපදිංචි තැපැලෙන් යවන ලද තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ සහතික කරන ලද ඡායා පිටපත , ප්‍රවේශ පත්‍රය යැවිය යුතු ෆැක්ස් අංකය.

**09 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම:-**

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිට සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ.පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එකක් පිළිගණු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුණුම් පත.
(11) වළංගුවිදේශ ගමන් බලපත්‍රයක්. **(Passport)**

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අභිමතය පරිදි අවලංගුකළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට අයදුම්කරුවන් අවනතවිය යුතුය. එකී නීති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්විය යුතුය.

**10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්:-**

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුයි.මෙම විභාග කොන්දේශියට අනුව යම්කිසි අපේක්ෂයන් විභාගයට පෙර, විභාගයේදී හෝ විභාගයට පසුව කුමන අවස්ථාවක සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත්,එයාගේ විභාගය අයිතිවාසකම් එම අවස්ථාවේදී අවලංකු කරනු ලැබේ.අයදුම්කරු සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, කුමන අවස්ථාවක හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කල හැක.

**11 විභාග පරිපාටිය:-**

11.01 ලිඛිත පරීක්ෂණය **:-** මෙම විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා දෙකින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම | මෙම ප්‍රශ්න පත්‍රය මගින් අයදුම්කරුගේ තර්ක කිරීමේ හැකියාව, සාමාන්‍ය බුද්ධිය, ගණිතය, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනුම මැන බලනු ලැබේ. | පැය01යි | 100 යි |
| 02 | භාෂා හකියාව | මෙම ප්‍රශ්න පත්‍රය, ග්‍රහණය කර ගැනීම, වැරදි සොයා ගැනීම, රචනා වල ව්‍යාකරණ භාවිතය හා තීරණ සටහන් කිරීම යනාදිය පිළිබඳ අපේක්ෂකයාගේ හැකියාව මැන බලනු ලැබේ. | පැය 01 ½ යි | 100 යි |

**සටහන :-**

මෙම විභාගය තරග විභාගයක් වුවත් එයින් පත්වීමට සුදුසුකම් ලැවීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයන් සඳහා වෙන් කර ඇති ලකුනු වලින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය. ලබා ගත් මුලු ලකුණු පදනම් කරගෙන ලකුණු අනු පිලිවෙළට ( Merit Order) පත්වීම් ලබාදෙනු ලැබේ.

**11.02 ප්‍රායෝගික පරීක්ෂණය :-** ලිඛිත පරීක්ෂණය සමත් වූ අපේක්ෂකයින් සුදුසුකම් පරීක්ෂණයට අදාළ විෂයයන් සම්බන්ධව ප්‍රායෝගික ව්‍යුහගත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මේ සම්බන්ධව පහත දක්වා ඇති ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| **01** | **සන්නිවේදන හැකියාව**<br>ඉදිරිපත් කිරීමේදී දක්වන දක්ෂතාව<br>(උදාහරණ -: කතන්දර කියාදීම) | 20 යි | 8 යි |
| **02** | **ඉදිරිපත් කිරීම**<br>ඉදිරිපත් කිරීමේ හැකියාව මැන බැලීම<br>(උදාහරණ -: අපේක්ෂකයා කුමක් හෝ නිර්මාණය කිරීමේදී බලාපොරොත්තු වන ඊට අදාළ හැකියාව) | 20 යි | 8 යි |
| **03** | **ඉවසීම**<br>දරුවන්ගේ හැසිරීමේදී බලාපොරොත්තු වන ක්‍රියාදාමය | 20 යි | 8 යි |
| **04** | **නම්‍යශීලි වීම**<br>වෙනස් වන පරිසරයේදී ඉගැන්වීමේ කටයුතු | 20 යි | 8 යි |
| **05** | **හැකියාව/ ශක්තිය**<br>ළමයින්ගේ හැකියාව හා ශක්තිය වර්ධනය කිරිම | 20 යි | 8 යි |
| | **එකතුව** | **100 යි** | **40 යි** |

**සටහන**

1. එක් එක් අපේක්ෂකයන් හට ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මිනිත්තු 15ක් ලබා දෙනු ලැබේ.
2. අපේක්ෂකයින් ප්‍රායෝගික පරීක්ෂණයේ සියලුම විෂයයන් සමත් විය යුතුය
3. අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට තමන්ගේ පළ පුරුද්දට අදාළ සහතික පත්‍ර ඉදිරිපත් කිරීම බලා පොරෙත්තු වේ.

**12 විභාග ප්‍රතිඵල :-**

අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **www.np.gov.lk** වෙබ් අඩවියෙහි පළ කරන අතර පසුවඋතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**13** මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්"** සතු වේ. ඒ සමගම දෙමළ හෝ සිංහල භාෂාවේ යම් කිසි වෙනසක් ඇතොත්, දෙමළ භාෂාවෙක් සඳහන් නිවේදනය නිවැරදි බව සැළකියයුතුවේ.

*ආර්. වරදලිංගම්*
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
16.05.2017